# ජාතික විද්‍යා පදනම
# தேசிய விஞ்ஞான மன்றம்
# National Science Foundation

NATIONAL SCIENCE FOUNDATION

ජාතික විද්‍යා පදනම 1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් ස්ථාපිත විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම ආයතනය රටේ තිරසාර සමාජ ආර්ථික සංවර්ධනයට උපකාර කිරීම සඳහා දේශීය පර්යේෂණ සහ සංවර්ධන පදනම ශක්තිමත් කිරීමේ ජාතියේ ප්‍රධාන ගාමක බලකාය වේ.

පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. පරිපාලන සහ මූල්‍ය ප්‍රධානී (01)**

අ) ව්‍යාපාර පරිපාලන/ කළමණාකරන/ ගණකාධිකරණ/ වාණිජ විද්‍යා උපාධිය

**සමග**

ව්‍යාපාර පරිපාලන/ කළමණාකරන/ ගණකාධිකරණ/ වාණිජ විද්‍යා පශ්චාත් උපාධි සුදුසුකමක්

**හෝ**

ICASL/ CIMA/ ACCA/ ICMASL (දේශීය/ විදේශීය) ආශ්‍රිත සාමාජිකත්වය.

**සහ**

රජයේ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ ආයතන හෝ පිළිගත් පුද්ගලික ආයතනයක කළමණාකාරීත්ව මට්ටමේ අවම වශයෙන් වසර 15ක පළපුරුද්ද, මින් වසර 5ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක විය යුතුය.

**හෝ**

ආ) ICASL/ CIMA/ ACCA/ ICMASL (දේශීය/ විදේශීය) අධි සාමාජිකත්වය

**සහ**

රජයේ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ ආයතන හෝ පිළිගත් පුද්ගලික ආයතනයක කළමණාකාරීත්ව මට්ටමේ අවම වශයෙන් වසර 15ක පළපුරුද්ද, මින් වසර 5ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක විය යුතුය.

**වයස් සීමාව :**

වයස අවුරුදු 35ට නොඅඩු විය යුතු අතර අවුරුදු 50ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය සහ කේතය :**

HM 1-3 රු: (86,865/- 15×2,270 - 120,915/-)

**(මූලික වැටුප 2019 -** රු.77,841/-)

මීට අමතරව, ප්‍රවාහන දීමනාව රු. 50,000/- ක්, ඉන්ධන දීමනාව (ලීටර් 120ක් සඳහා), සන්නිවේදන දීමනාව රු. 8,500/- ක් සහ වෘත්තීය දීමනාවක් ගෙවනු ලැබේ.

**2. රහස්‍ය ලේකම් (01)**

සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. සා.පෙළ විභාගයෙන් විෂයන් හයක් සමත් වීම.

**සහ**

අ.පො.ස. උ.පෙළ විභාගයෙන් විෂයන් තුනක් සමත් වීම සහ වරලත් ලේකම්වරුන්ගේ ආයතනයේ අවසාන පරීක්ෂණය හෝ පිළිගත් ආයතනයක ලේකම් පරිචය පිළිබඳ ඩිප්ලෝමාවක් හදාරා තිබීම. (අවුරුදු 2කට නොවැඩි)

**සහ**

රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අදාළ තනතුරේ වසර 10කට නොඅඩු සේවා පළපුරුද්ද.

**වයස් සීමාව :**

වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය සහ කේතය :**

JM 1-2 රු: (43,355/- 10×755- 18×1135- 71,335/-)

**(මූලික වැටුප 2019 -** රු.38,862/-)

**3. පරිගණක චිත්‍රක සැළසුම් සහකාර (01)**

**වෘත්තීය**

තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිසම් සභාව විසින් පිළිගත් කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 05 මට්ටමට (NVQ Level 05) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වයස් සීමාව :**

වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය සහ කේතය :**

MA 2-2 රු: (30,310/- 10×300 -7×350 - 4× 600 - 20×710 - 52,360/-)

**(මූලික වැටුප 2019 -** රු.27,170/- + ගැළපීම් දීමනාව රු.382/-)

EPF සහ ETF මෙන්ම භාණ්ඩාගාරයෙන් අනුමත වෙනත් දිරි දීමනා ප්‍රතිලාභවලට ඇතුළත් වේ. ඉහත වැටුප් පරිමාණයට අමතර කලින් කලට රජය විසින් නිර්දේශ කරනු ලබන දීමනා/ ජීවන වියදම් දීමනා සඳහා තෝරාගත් අපේක්ෂකයන් හිමිකම් ලබනු ඇත.

කරුණාකර, ජීවදත්ත, අධ්‍යාපන සහ වෘත්තීය නිපුණතා සහතිකවල පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනය සහිතව ලියාපදිංචි තැපෑලෙන් අයදුම් කරන්න. අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය. අයදුම්පත්‍රයක් සඳහා කවර හෝ ආකාරයක උපකාර ලබා ගැනීමට ක්‍රියා කිරීම නුසුදුසුකමක් වනු ඇත. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල හෝ සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් යොමු කළ යුතුය. ජාතික විද්‍යා පදනම පිළිබඳ සහ පුරප්පාඩු පිළිබඳ තොරතුරු *www.nsf.gov.lk* යන වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

අයදුම්පත්, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික විද්‍යා පදනම, 47/5, මේට්ලන්ඩ් පෙදෙස, කොළඹ - 07 යන ලිපිනයට එවිය යුතුය.

**අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය : 2019-06-26**

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික විද්‍යා පදනම**
**අංක 47/5, මේට්ලන්ඩ් පෙදෙස,**
**කොළඹ 07.**